103

# උඩරට වතුකරයේ දෙමළ ව්‍යවහාරය
## පිළිබඳ වාග් විද්‍යාත්මක විග්‍රහයක්
### (හපුතලේ උප දිසාපති කොට්ඨාශය ආශ්‍රිතව)

ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණයේ ඒකදේශ
අවශ්‍යතාවක් සපුරාලීම් වශයෙන්
ඉදිරිපත් කෙරෙන නිබන්ධය යි.

103
අංකය

කැලණිය විශ්ව විද්‍යාලය

1988

කදුරුගමුවේ නාගිත හිමි

## සාර සංග්‍රහය

විග්‍රහාත්මක වාග්විද්‍යා විධි නියමානුකූල ව උඩරට වතුකරයේ දෙමළ ව්‍යවහාරය පිළිබඳ වාග් විද්‍යාත්මක විග්‍රහයක් ඉදිරිපත් කිරීම මෙම නිබන්ධයේ අභිප්‍රේතාර්ථය යි. මෙය හැඳින්වීමකින් සහ පරිච්ඡේද හතරකින් ද උපග්‍රන්ථ දෙකකින් සහ වාග් කෝෂයකින් ද සමන්විත ය.

0. හැඳින්වීම:

උඩරට වතුකරයේ දෙමළ ජනතාවගේ ජීවන තොරතුරු තරමක් දීර්ඝව ද, මේ නිබන්ධයට අදාළ අතිරේක තොරතුරු කෙටියෙන් ද සාකච්ඡා කෙරෙයි.

1. පළමු පරිච්ඡේදය : ශබ්දිම විචාරය.

උක්ත උපභාෂාවේ බණ්ඩය ශබ්දිම මූල ප්‍රස්තරය, අනු ප්‍රස්තරය යටතේ විග්‍රහ කෙරෙන අතර වර්ණ සංස්ථිතිය, ස්වරණය පිළිබඳ කරුණු ද විමැසෙයි.

2. දෙවන පරිච්ඡේදය : පදිම ශබ්දිම විකල්පන

මේ පරිච්ඡේදයෙන් සන්ධි, පදිම ශබ්දිම විකල්පන යන සිරස්තල යටතේ මේ භාෂාවේ පදිමාන්තරව හෝ පදිම තුළ සිදුවන විවිධතා සොයා බැලේ.

3. තෙවන පරිච්ඡේදය : පදිම විග්‍රහය.

නාම පද, ක්‍රියා පද, විශේෂණ පද, හා අව්‍ය පද පිළිබඳ කරුණු මෙහි දී විග්‍රහ කෙරෙයි.

4. සතර වන පරිච්ඡේදය: වතුකරයේ දෙමළ උපභාෂාවෙහි විශේෂතා.

වතුකරයේ දෙමළ උප භාෂාව පිළිබඳ අපගේ විග්‍රහයේ ප්‍රතිඵලිත තොරතුරු, යාපනයේ දෙමළ උප භාෂාව හා දකුණු ඉන්දියාවේ භාවිත දෙමළ ව්‍යවහාරය සමඟ ශබ්දිම, ව්‍යාකරණ, කෝෂීය, ප්‍රස්තර යටතේ තුලනය කොට වතුකරයේ දෙමළ උපභාෂාවෙහි විශේෂතා සටහන් කිරීම මේ පරිච්ඡේදයේ දී සිදුවෙයි.

උච්චාරණය හා සම්බන්ධ සන්ධානය, ද්‍රැත විලම්බිත උච්චාරණයේ විශේෂතා උපග්‍රන්ථ I හි ද ප්‍රායෝගික අර්ථ විචාර සිද්ධාන්ත - වලට අනුව සංවාද සංස්ථිති පිළිබඳ කෙටි හැඳින්වීමක් උපග්‍රන්ථ II හි ද ඉදිරිපත් වෙයි.

විග්‍රහාත්මක වාග් විද්‍යා විෂයක්ෂෙත්‍රයෙහි ව්‍යාප්තිය පෑවුල වීම් වශයෙන් ද, ශ්‍රී ලංකාවේ ජාතික භාෂාවක් වන දෙමළ භාෂාවෙහි උපභාෂාගත තොරතුරු රැස් කිරීමක් වශයෙන් ද ශ්‍රී ලාංකික සිංහල - දෙමළ ජනයා අතර සමාජාන්තර අවබෝධය පුළුල් කිරීම් වශයෙන් ද මේ නිබන්ධය ශාස්ත්‍රීය තොරතුරු එකතුවක් වෙයි.

## Abstract


The purpose of this thesis is to analyse the language used by Indian Tamils in Hill Country, Sri Lanka, in accordance with the structural linguistic point of view. It consists of an introduction, four chapters, two appendices and glossary.

0. Introduction :

The life style of the people is discussed broadly but the additional remarks on this thesis is discussed in brief.

1. Chapter one : Phonemics

The segmental phonemes are analysed under two headings; 1. main system.
2. sub system. and syllable structure and stress are discussed respectively.

2. Chapter two : morphophonemic analysis

The changes in morphemes and morpheme boundaries are discussed under the headings "Sandhi" and "morphophonemic variations" in this chapter.

3. Chapter three : Morphological analysis.

Forms, i.e. Noun, Verbs, Adjectives and all other uninflected forms are dealt with in this section.

4. Chapter four : Special features of Estate Tamil.

The facts, we have obtained as a result of the above analysis are compared with Tamil dialect of Jaffna and Tamil dialect in southern India; and special features at the phonemic and grammatical levels are spotlighted.

In addition there are two appendices:

Appendix I - discusses juncture and tempo - variations on the pronounciation.

Appendix II - discusses conversational structures, according to the theories shown in pragmatics.

This study would be a small contribution to widen general linguistic studies in Sri Lanka. Additionally it would serve as a collection of data in Estate Tamil Dialect and as a source of widening the inter-social understanding between Sinhalese and Tamil communities.